# ජාතික අධ්‍යාපන ආයතනය
## සංඥා භාෂාව පිළිබඳ පාඨමාලා - 2019
## අයදුම්පත් කැඳවීම

ජාතික අධ්‍යාපන ආයතනයේ අන්තර්කරණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් මෙහෙයවනු ලබන උක්ත පාඨමාලා සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

**පාඨමාලාවේ ස්වභාවය**

සංඥා හඳුනා ගැනීම, සංඥා භාෂාවෙන් අදහස් හුවමාරු කිරීම, සංඥා භාෂා පරිවර්තනය සහ සංඥා භාෂාවෙන් ඉගැන්වීම පිළිබඳව නිපුණතා ලබා දීම මෙහි අරමුණ වේ. එක් අවුරුදු අර්ධකාලීන සති අන්ත පාඨමාලාවක් වන මෙහි අධ්‍යයන සැසි ජාතික අධ්‍යාපන ආයතනයේදීත්, ප්‍රායෝගික සැසි විශේෂ පාසල්වලදීත් පැවැත්වීමට කටයුතු සම්පාදනය කර ඇත. **උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පාඨමාලා සඳහා සකස් කර ඇති ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව (Sri Lanka Qualifications Framework)** අනුව මෙම පාඨමාලාව සකස් කර ඇත.

1. **සංඥා භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව**

**ඉල්ලුම් කිරීම සඳහා සුදුසුකම්**

අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සමත් වීම
සහ
රජයේ හෝ රජයේ අනුමත පාසලක හෝ පිරිවෙනක ගුරුවරයකු වීම
හෝ
ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයක / ගුරු විද්‍යාලයක ගුරු අධ්‍යාපනඥයකු වීම
හෝ
ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරියකු වීම
හෝ
ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරියකු වීම
හෝ
විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන් සම්බන්ධ ව කටයුතු කරන පාසලක/ආයතනයක සේවයේ නියුක්ත ව සිටීම
සහ
2018.11.30 දිනට වයස අවුරුදු 55 ට අඩු වීම

2. **සංඥා භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව**

**ඉල්ලුම් කිරීම සඳහා සුදුසුකම්**

2018.11.30 දිනට වයස අවුරුදු 55 ට අඩු වීම
අ.පො.ස. (සා.පෙළ) සමත් අයෙකු වීම
සහ
විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන් සම්බන්ධ ව කටයුතු කරන පාසලක/ආයතනයක සේවයේ නියුක්ත වී සිටීම

**පාඨමාලා ගාස්තු**

| ගාස්තු | ඩිප්ලෝමා පාඨමාලාව | සහතික පත්‍ර පාඨමාලාව |
|---|---|---|
| ඉල්ලුම් පත් ගාස්තු | 200.00 | 200.00 |
| ලියාපදිංචි ගාස්තු | 1000.00 | 1000.00 |
| පාඨමාලා ගාස්තු | 30000.00 | 20000.00 |

**ඉල්ලුම් කළ යුතු පිළිවෙළ**

- ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් තම නම, තනතුර, රාජකාරි හා පෞද්ගලික ලිපිනය, උපන් දිනය, අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් ඇතුළත් වන සේ තමා විසින් පිළියෙල කර ගත් අයදුම්පතක්, මහරගම ලංකා බැංකුවේ, ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 607628 දරන ගිණුමට බැරවන සේ දිවයිනේ ඕනෑ ම ලංකා බැංකු ශාඛාවකට රු.200.00 ක මුදලක් ගෙවා ලබා ගත් කුවිතාන්සිය සමග **"අධ්‍යක්ෂ, අන්තර්කරණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම"** යන ලිපිනයට **2018 නොවැම්බර් මස 30** දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. (මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් භාරගනු නොලැබේ.) අයදුම් පත්‍රය බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"සංඥා භාෂාව පිළිබඳ ඩිප්ලෝමා/සහතික පත්‍ර පාඨමාලාව - 2019"** යනුවෙන් සඳහන් කළ යුතුයි. පාඨමාලාව සඳහා ගෙවන ලද මුදල් කිසිම හේතුවක් මත ආපසු ගෙවනු නොලැබේ.

**පාඨමාලාවට තෝරා ගැනීම**

- සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගනු ලැබේ.

අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
2018.09.28